**ශීර්ෂය 402 - ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝම්බර් 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝම්බර් 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව රාජ්‍ය අමාත්‍යාංශයක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ඒසීඒ-සී ආකෘති පත්‍රය) දළ පදනමින් පිළියෙල කළ යුතු වුවද රාජ්‍ය අමාත්‍යාංශය විසින් ශුද්ධ පදනමින් පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය. | මින් ඉදිරියට මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමින් පිළියෙළ කිරීමට කටයුතු කරන බවට කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතු වීම. |

### 1.6.2 ආදායම් ලැබීම්

-------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් රැස් කළ රු. 2,716,902 ක් වූ ආදායම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 10.1 ඡේදයට අදාළ මාර්ගෝපදේශ අංක 6හි 7(ii) ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් ලද අත් මුදල් ලෙස සලකා එසීඒ 3 ආකෘතියේ සටහන් කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ චක්‍රලේඛ ප්‍රකාරව නියමිත ආකෘතියේ එකතු කරනු ලබන ආදායම ඇතුළත් කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

## 1.6.3 රජයේ අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාමාජික ණය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු.611,184 ක් වූ ආපදා ණය අයකරගෙන නොතිබුණු අතර මෙම ණය අය නොකිරීමට හේතු, ණය අය නොකළ කාලය, ණය නොගෙවීමට හේතු ඇතුලත් ලැබීමට ඇති ණය අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණ ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. තවද මෙම ණය ශේෂ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල සේවයේ නියුක්ත අයගෙන් අයවිය යුතු ණය ශේෂ ලේඛනයේ ඇතුලත් කර තිබුණි. මෙම ණය ශේෂයන් 2018 වර්ෂයේදී පවරා දී ඇතත් එම නිලධාරීන් අමාත්‍යාංශයේ සේවය නොකරන හිඟ ගිණුම්වල ගැලපීමට ද කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | නියමිත පරිදි ණය වාරික අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම |

## 1.6.4 දේපල පිරියත හා උපකරණ

---------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ විසර්ජන පනත අනුව ශීර්ෂ අංක 194 තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ යටතේ පැවති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය රාජ්‍ය අමාත්‍යාංශයට මාරු කර තිබුණි. එම ආයතනවලට අදාළ රු.221,331,725 ක් වූ මූල්‍ය නොවන වත්කම් හා රු.231,690,858 ක් වූ නොනිමි වැඩ මෙම රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණිත දින (2021 අප්‍රේල් 21 දින) වන විටත් පවරා ගෙන නොතිබුණු අතර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කර මෙම වසර තුළදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය නොවන වත්කම් අප්‍රමාදව පවරා ගැනීමට කටයුතු කල යුතු වීම සහ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් අගය නිවැරදිව ඇතුලත් කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව 2019 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණු ඉන්වෙන්ට්‍රි අයිතම 821 ක් මුදල් රෙගුලාසි අංක 751 හා 804 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛන වලට ඇතුලත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ කොටසකට අදාළ වටිනාකම් ලබාගෙන ඇති අතර ඉතිරි භාණ්ඩ තක්සේරු කිරීම සඳහා තක්සේරු කමිටුවක් පත් කර ඇත. ඉන්පසුව මෙම වත්කම් වල වටිනාකම් පොත්වලට ඇතුලත් කරනු ලැබේ. | නියමිත පරිදි වත්කම් කළමනාකරණය හා ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනය රු.940,099,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.554,799,270 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් රු.385,299,730 ක් හෙවත් සියයට 41 ක් ඉතිරි වී තිබුණි. | පූර්වාදර්ශ වියදම් පුරෝකථනයක් රහිතව ප්‍රතිපාදන ලැබී ඇති බැවින් හා කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතු වීම. |
| (ආ) මෙහෙයුම් වැඩසටහන 1 යටතේ මූලධන වැය විෂයයන් 02 ක් හා පුනරාවර්තන වැය විෂයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.132,024,592 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 94 දක්වා පරාසයක පැවතුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්ථන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.4,125,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | විදේශ ගමන් සිදුනොවීම, ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා නොකිරීම, වාහන මිලදී නොගැනීම හා මූ.රෙ 66,69 යටතේ ප්‍රතිපාදන මාරු නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |
| (ඈ) | සංවර්ධන වැඩසටහන 2 යටතේ මූලධන වැය විෂය 09 ක් හා පුනරාවර්ථන වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.265,206,216 ක් වූ ඉතිරිවීම් එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 98 දක්වා පරාසයක පැවතුණි. | ක්‍රීඩා වෛද්‍ය ආයතනය හා ක්‍රීඩා විද්‍යායතනයට අදාළ වැඩසටහන් 02 ක් එකතු කර ඇති බැවින් නිවැරදි චිත්‍රයක් පිළිඹිබු නොවේ. ඉහත (ඇ) හා (ඈ) යටතේ පිළිතුරු අදාළ වේ. | -එම- |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

---

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ඡේදයට අනුව 2020 වර්ෂයේ වාර්තා නොකරන ලද කිසිඳු බැරකමක් 2021 වර්ෂයේ නිරවුල් නොකල යුතු වුවද, එයට අනුකූල නොවන පරිදි 2020 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලැබීමට අදාළව එකතුව රු.4,455,999 ක් සඳහා 2021 වර්ෂයේදී ගෙවීම් සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල එම වියදම් බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණි. | ගෙවීම් ප්‍රමාණය හා පරාසය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු නව රාජ්‍ය අමාත්‍යාංශය තුළ නොතිබුණි. ඉදිරියේදි බැරකම් සටහන් කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකසනු ලැබේ. | බැදීම් වලට එළඹීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ. 94 (1) ඡේදය අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයයන් 09 ක් සඳහා ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු රු.2,712,405 ක බැරකම් සඳහා එලඹ තිබුණ බව නිරීක්ෂණය විය. | නව රාජ්‍ය අමාත්‍යාංශයක් බැවින් අයවැය දෙපාර්තමේන්තුව ඔවුන් විසින් සිදුකරන ලද උපකල්පන මත ඇස්තමේන්තු සකස් කර දී ඇත. එම ප්‍රතිපාදන සියළු වියදම් ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවූ බැවින් ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා යන ප්‍රමාණයකින් 2021 වසර තුළ වියදම් දැරීමට සිදු විය. | -එම- |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

------------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති එලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වන අතර මේ සම්බන්ධයෙන් සමාලෝචනයක් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සඵලදායී මූල්‍ය පාලනයක් සහ අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම වෙනුවෙන් විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් වලට අමතරව ගණන් දීමේ නිලධාරියාගේ සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් නිරන්තරව මාණ්ඩලික හා කාර්ය මණ්ඩල රැස්වීම් පැවැත්වූ බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>අදාළ සමාලෝචන වාර්තාවල පිටපත් ඉදිරියේදී විගණකාධිපති වෙත යැවීම සම්බන්ධයෙන් කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

----------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිකාරම් 'බී' පාලන ගිණුම අනුව වැඩ තහනම් කළ, විශ්‍රාම ගිය, සේවය අතහැරගිය හා මියගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු.827,141 ක් වූ ණය ශේෂයක් අයකර ගත යුතුව පැවතුණි.. | මෙම ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අයවිය යුතු ණය ශේෂයන් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කලයුතුවීම. |

## 2.5 තැන්පත් ශේෂයන්

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.9,440,409 ක් වූ හා වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.65,653 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ දෙක ඉක්මවා ඇති තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය - වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය හා වෙනත් අමාත්‍යාංශ වලින් ලැබී ඇති වාහන 16 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් උපයෝජනය කරනු ලබන අතර එම වාහන රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.<br><br>එයට අමතරව 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබුණු වාහන 03 කට අදාළ පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි | වාහනවල අයිතිය කඩිනමින් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.<br><br>වාහන 3හි පිරිවැය ගණනය කිරීම පිළිබඳ විධිමත් සාක්ෂි අමාත්‍යාංශය සතු නොවන අතර පිරිවැය නැවත තක්සේරු කර ඉදිරියේදී සකස් කරන මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කරනු ලැබේ. | වාහනවල අයිතිය අප්‍රමාදව පවරා ගැනීමට කටයුතු කල යුතු වීම සහ වාහනවල පිරිවැය නිවැරදිව ගිණුම් ගත කල යුතුවීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශය හා ඊට ඇතුළත් එක් ආයතනයක් වන ජාතික ක්‍රීඩා විද්‍යායතනය තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට ඉලක්ක ස්ථාපිත කර තිබුණද අවශ්‍ය කටයුතු සිදුකර ප්‍රගතියක් ලඟාකර ගෙන නොතිබුණි. එසේම රාජ්‍ය අමාත්‍යාංශයට අයත් ක්‍රීඩා වෛද්‍ය ආයතනය තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට ස්ථාපිත එක් ඉලක්කයක් පමණක් සපුරා ගැනීමට | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය වන දිගු කාලීන බලපෑම් අමාත්‍යාංශය පිහිටුවා මාස 04 ක් වැනි කෙටි කාලයකදී සිදුකල ව්‍යාපෘති පහකින් මැනීම ප්‍රායෝගික නොවන බැවින් ජයග්‍රහන ප්‍රතිශතයක් ලෙස දැක්වීමට කටයුතු නොකරන ලදී. 2020 වර්ෂයේදී | තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමට අවශ්‍ය ප්‍රගතිය ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය නියමිත ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කල යුතු වීම. |

| | |
|---|---|
| අවශ්‍ය කටයුතු සිදුකර සියයට 65 ක ප්‍රගතියක් ලගා කර ගෙන තිබුණි. | හඳුනාගෙන ක්‍රියාත්මක වූ ව්‍යාපෘති රැසක් **Covid -19** වසංගත තත්ත්වය යටතේ සැලසුම් කල පරිදි කරගෙන යාමට බාධා ඇති විය. |

**5. යහපාලනය**

**--------------**

**5.1 අභ්‍යන්තර විගණනය**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර නොතිබුණ අතර රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක වූ 2020 සැප්තැම්බර් 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය හා එය යටතේ පවතින ආයතන සඳහා සාර්ථක අභ්‍යන්තර විගණනයක් සිදුවී නොමැති අතර 2021 ජුනි මස සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ඇත. | නියමිත සැලැස්මකට අනුව අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වීම සහ අප්‍රමාදව අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර ගත යුතු වීම |

**6. මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශය සහ එයට අයත් ක්‍රීඩා වෛද්‍ය ආයතනය සහ ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 15 ක් තෘතිය මට්ටමේ පුරප්පාඩු 10 ක්ද, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 29 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් ඇතුළු මුළු පුරප්පාඩු සංඛ්‍යාව 62 ක් පැවතුණි. ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි වැදගත්වන අධ්‍යක්ෂ ජනරාල්, පරිපාලන නිලධාරි හා හෙද නිලධාරි සහ ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කථිකාචාර්ය තනතුරු 10 ක් ඇතුළු සේවක ඌනතාවයන් පැවති බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීම අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැර කටයුත්තක් වන අතර ඉල්ලීම් කරමින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | හිග කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතු වීම. |